






# අධිෂ්ඨාන යෙන් ප්‍රගතිය කරා පියනඟන්න...

ඔබත් කියවන්න...

**“ තමා හට ලැබෙන ධනය කොටස් හතරකට බෙදා වෙන් කර ගත යුතුය.**
**ඉන් එක් කොටසක් සිය පරිභෝජනය සඳහා ද,**
**කොටස් දෙකක් සිය කර්මාන්තයේ දියුණුව සඳහා ද,**
**ඉතිරි කොටස හදිසි ආපදාවකදී ගැනීමට තැන්පත් කර තැබීම සඳහා ද**
**යොදා ගත යුතුය. ”**

-සිඟාලෝවාද සූත්‍රය-

ජීවිතයේ අනේකවිධ අධිෂ්ඨානයන් වෙනුවෙන් අපි අපේ ආදරණීයයන් තනිකරදමා විදේශගත වන්නේ කුමක් අරබයාද ?
ඒ, හිතේ දහසක් පැතුම් සැබෑ කර අපේ කැදැල්ලේ හෙට දවස වඩාත් පැහැබර කරගන්නයි., කිසිවෙකුටවත් අතනොපා ජීවත් වීමටයි. එලෙස දුක් මහන්සියෙන් මුදල් ඉපැයූ පමණින්, අතමිට සරු වූ පමණින් අපගේ අධිෂ්ඨාන මල්ඵල ගැන්වේද ?
අතට ලැබෙන මුදල් නිසි කළමනාකාරීත්වයකින් තොරව වියදම් කිරීමෙන් අපගේ අධිෂ්ඨාන වෙත ළඟා විය හැකිද ?

මෙපමණ දුක් මහන්සියෙන් ඉපැයූ මුදල් නොදැනුවත්කම නිසා නිකරුණේ අපතේ යෑමට ඉඩ නොහරින්න !

**බිඳක් සිතන්න...**

# අපි ජීවිතය වෙනුවෙන් ඉතිරි කිරීමට අධිෂ්ඨාන කරගත යුත්තේ ඇයි ?



- අපගේ ජීවිතය නිසි අයුරින් හසුරවා ගැනීමට- අපට කිසිවෙකුටවත් යටත් නොවී ජීවිත් වීමට හා ස්වාධීනව කටයුතු කරගැනීමට
- කිසිවෙකුගෙන් යැපෙමින් හෝ කිසිවෙකුගෙන් උපකාර ලබමින් ජීවත් නොවීමට
- ජීවිතයේ අපට ඇති අරමුණු ජය ගැනීමට - අධ්‍යාපනයට, නිවසක් ඉදිකර ගැනීමට, මව්පියන්ට ඇපඋපස්ථාන කිරීමට, විවාහයට ආදී නොයෙක් අවශ්‍යතාවන් සඳහා
- හදිසි අවස්ථාවන් හිදී ජීවිතයට ආරක්ෂාවක් ලබාගැනීමට - හදිසි සෞඛ්‍ය ගැටළු, හදිසි අනතුරු, ස්වාභාවික විපත් ආදියෙන්





- අපගේ ජීවිතයේ නොයෙකුත් අවශ්‍යතාවන් ඉෂ්ඨ කර ගැනීමට
- අවශ්‍ය වු විටෙක අපටම කියා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට
- ඉතිරි කිරීම සඳහා අනෙකුත් අයට ආදර්ශයක් සැපයීමට
- අපි ළඟ ඉතිරියක් තිබෙන විට ජීවිතය සතුටින් භුක්ති විඳීමට හැකියාවක් ලැබෙයි
- අපට නැවත නැවත විදේශගතව දහදුක් විඳ අන්‍යයන්ට සේවය කිරීමට අවශ්‍ය නොවෙයි
- අපි අද මේ කරන ඉතිරියෙන් අනාගතයේදී කිසිම පැකිළීමකින් තොරව මූල්‍ය අවශ්‍යතාවන්ට මුහුණ දීමට හැකි පසුබිමක් තනාගැනීමට හැකියාවක් ලැබෙයි

## අපගේ අධිෂ්ඨානය වෙත පියනඟන්නට, ඉතිරි කළ යුතු මාර්ගය

- දිගුකාලීනව මුදල් ඉතිරි කිරීමට අප හට තිබෙන දැඩි වුවමනාව සහ අපට දිනපතා සුළු මුදලක් හෝ ඉතිරි කිරීමට හැකියාවක් තිබිය යුතුය

- මෙය ඇරඹීම සඳහා, අපිට අපගේ අනාගතය කෙරෙහි වටිනාකමක් තිබිය යුතු අතර අපගේ අනාගතය වෙනුවෙන් මුදල් ඉතිරි කළ යුතු බව සහ එයට ඇති හැකියාව අපේ හදවතින්ම තීරණය කිරීම හැර වෙනත් කිසිම මාර්ගයක් අවශ්‍ය නොවේ



## ලොව දිනූ එවන් අධිෂ්ඨානයකින් යුත් මිනිසෙක්...



2011 වසරේ ලොව ධනවත්ම පුද්ගලයන් අතර 3වැනි ස්ථානයට පත් වූ වොරන් බෆට්, ළමා කාලයේ සිටම මුදල් ඉපැයීමට සහ ඉතිරි කිරීමට උනන්දුවක් දැක්වූවෙකි. සෑම දිනක්ම පාහේ චුවින්ග්ගම්, කොකා කෝලා හෝ සතිපතා සඟරාවක් විකිණීම සඳහා හෙතෙම දොරින් දොරට ඇවිද ගියේය. ඇතැම් විට මොහු තම සීයාට අයත් සිල්ලර වෙළඳසැලෙ හි වැඩ කළේය. උසස් අධ්‍යාපනයේ නියැලෙන අතර තුර පුවත් පත් බෙදා හැරීම, ගොල්ෆ් බෝල සහ මුද්දර විකිණීම, මෝටර් රථ මෙහෙයුම් කටයුතු ආදී නොයෙකුත් ජීවනෝපායන් මගින් මොහුට සාර්ථක ලෙස මුදල් උපයාගැනීමට හැකි විය.



1944 දී සිය පළමුවන ආදායම් බදු පෝරමය පිරවූ බෆට්, තම පා පැදියෙන් තමන්ගේ පුවත්පත් බෙදාහැරීමේ කටයුතු පරීක්ෂා කිරීම වෙනුවෙන් ඩොලර් 35ක අඩුකිරීමක් ලබාගත්තේය. උසස් අධ්‍යාපනයේ දෙවැනි වසර වූ 1945 වසරේදී තම ප්‍රදේශයේ බාබර් සාප්පුවකට, පාවිච්චි කරන ලද පින්බෝල යන්ත්‍රයක් සැපයීමට බෆට් තම යාළුවෙකු සමග එක්ව ඩොලර් 25ක් වැය කළේය. මාස කිහිපයක් ඇතුළත දී බොහෝ බාබර් සාප්පුවල පින්බෝල යන්ත්‍රයන් ඔවුන් සතු විය.

- පෞද්ගලික ඉතිරි කිරීම් ඇරඹීම සඳහා බැංකු ගිණුමක් පටන්ගැන්ම වැනි නිරවුල් සුරක්ෂිත කිසිවක අපගේ ඉතිරි කිරීම් ඇරඹීම සුදුසුය
- අපේ අතට මුදලක් ලැබෙන සමවිටම එයින් සුළු මුදලක් හෝ ඉතිරි කළ යුතුය
- අපට ලැබෙන ලාභය හෝ එම ලාභය තව තවත් ඉහළ නැංවීමට වඩා අපගේ පෞද්ගලික ඉතිරි කිරීම් ක්‍රමවත්ව නංවාලීමට සැමවිටම අවධානය යොමු කළ යුතුය
- අනාගතයේ කිසිදු පැකිළීමකින් හෝ අතපෑමකින් තොරව මුදල් පහසුකම් අප සතු කරගැනීමට, අපගේ ඉදිරි ඉලක්ක සහ හිතේ ඇති අධිෂ්ඨාන මල්එල ගන්වා ගැනීමට (උදා: වාහනයක්, නිවසක්, ඉඩමක් ආදිය මිලදී ගැනීමට)

# අධිෂ්ඨාන සඵල කර ගැනීමට අපි බැංකුවක් සමග ඉතිරි කළ යුත්තේ ඇයි ?

- බැංකුවක් යනු අපගේ මුදල් ඉතා සුරක්ෂිතව තැන්පත් කළ හැකි ස්ථානයයි
- අපගේ මුදල් හෝ වටිනා භාණ්ඩවල සුරක්ෂිතභාවය ඉහළින්ම සහතික කරයි
- දිගු කාලීන සහ කෙටි කාලීන ඉතිරි කිරීම් සඳහා ඉතා යෝග්‍යතම තැනක් වීම, එමෙන්ම අපට අවශ්‍ය වූ විටෙක අවශ්‍ය පරිදි මුදල් තැන්පත් කිරීමටත්, මුදල් ආපසු ගැනීමටත් හැකි වීම
- අප පවත්වාගෙන යන දෛනික ශේෂය මත පොලිය ගෙවන බැවින් තව අමතර මුදලක් ඉපැයීමට හැකි වීම
- බැංකුවක් සැමවිටම ශ්‍රී ලංකා මහ බැංකුවෙ හි ලියාපදිංචිව එමගින් පාලනය වීම නිසා අපට අපගේ මුදල් පිළිබඳ බියක්, සැකක්, අවිශ්වාසයක් ඇති නොවෙයි
- බැංකුවක් සමග ඉතිරි කිරීමේදී අවදානම් තත්ත්වයන් අඩුය
- හදිසි අවස්ථාවකදී ණය මුදලක් ලබාගැනීමට අපට හැකි වෙයි
- අනෙකුත් මූල්‍ය අවශ්‍යතාවන් සඳහා අප හට පුළුල් ප්‍රවේශයක් ලබාදෙයි
- අපගේ මුදල් සහ අනෙකුත් වත්කම් ක්‍රමානුකූලව පරිහරණය කිරීමට, ක්‍රමානුකූලව සැලසුම් කිරීමට බැංකුව සැමවිටම උපකාර වෙයි







## අධිෂ්ඨානය වෙත පියනඟන විට ඔබට අපගෙන් ලැබෙන අත්වැල සහ වරප්‍රසාද

- ඕනෑම අයෙකුට සුළු මුදලකින් වුවත් ඉතිරි කිරීමේ ගිණුමක් ඇරඹීමට අවස්ථාව ලබාදීම
- ඉතිරි කිරීමට දිරිගන්වන, මඟ කියාදෙන සුවිශේෂී ඉතිරි කිරීමේ ගිණුම්
- ඉතිරි කිරීමේ සිට ණය සේවාවන් දක්වා උසස් වීම්
- ඔබට ව්‍යාපාරයක් ඉතා කුඩා පරිමාණයෙන් ආරම්භ කර එය වර්ධනය කරගැනීම සඳහා පිරිනමන සුළු පරිමාණ ණය (රු. 25,000/- සිට රු. මිලියනයක් දක්වා)
- ඔබට නිවසක් තැනීමට හෝ අලුත්වැඩියා කිරීමට (රු. 50,000/- සිට රු. මිලියනයක් දක්වා ණය)
- විවාහ සහකරුට දෛනික සෞඛ්‍ය ආවරණයක් සහිතව, ඔබ සහ ඔබගේ විවාහ සහකරු ආවරණය කෙරෙන රක්ෂණයක්
- රු. 100,000 සඳහා වන රක්ෂණ ඔප්පු සැලසුම වෙනුවෙන් පළමු වසරේ වාරික මුදලින් 50%ක් හැටන් නැෂනල් බැංකුව විසින් ගෙවනු ලබයි
- කුඩා ඉතිරි කිරීමක් සහිත වුවද ඔබ වෙත ජයග්‍රහණ අවස්ථා සැලසෙන ලොතරැයි දිනුම් ඇදීමක්

# ඉතිරි කිරීම් සඳහා උපදෙස්



- අපහසුම කාර්යය වන්නේ පළමු පියවර තබා මුදල් ඉතිරි කිරීම ඇරඹීමයි.
එමනිසා අදම ආරම්භ කර යම් මුදලක් ඉතිරි කරන්න.

- සුළු මුදලකින් හෝ ඉතිරි කිරීම අරඹන්න.

- ඇවිදීමට පෙර දණගෑම ඉගෙන ගැනීමටත්,
දිවීමට හැකිවීමට පෙර ඇවිද යාම ඇරඹීමටත් අප උගත යුතුය.
එමනිසා ආයෝජනය කිරීමට හෝ ලාභ ලැබීමට උත්සාහ කිරීමට
පෙර ඉතිරි කිරීමට ඉගෙන ගනිමු.

- ජීවිතයේ ඉලක්කයක් ඇති කරගන්න., අධිෂ්ඨානයෙන් එය කරා යන්න.
මූල්‍යමය සාර්ථකත්වයේ මූලික පදනම එයයි.



- ඔබ උපයන ප්‍රමාණයට වඩා අඩුවෙන් වියදම් කරන්න -
ධනය රැස්කර ගැනීමේ රහස එයයි.

- මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් දැනුම ලබාගන්න.,
ඔබේ බැංකුකරුට කථාකරන්න.

- හදිසි අවස්ථාවන් සඳහා ගත හැකි අරමුදලක් ගොඩනගා ගන්න. ඔබගේ ආදායම් හා වියදම් දිනපතා පොතක සටහන් කරගන්න. මෙමගින් ඔබ අත ඇති මුදල ඵලදායී දෙයකට යොමු වේද යන්න ඔබටම මැන ගත හැකිවේ.

- නිරතුරුවම ඔබේ පවුලේ දෛනික මුදල් කළමනාකරණයට සහභාගී වෙමින් ඔබේ බිරිඳ සමග වියහියදම් පිළිබඳව සාකච්ඡා කරන්න. ක්‍රමානුකූලව මුදල් පරිහරණය කරන ආකාරය ඇයත් සමග සැලසුම් කරන්න.

- මුදල් අහිමි වීමේ බිය, අසාර්ථක වේද යන බිය හෝ ආයෝජනය පිළිබඳ නොදන්නාකම යන හේතූන් නිසා කිසිවිටෙකවත් ආයෝජනයන් සඳහා පසු නොබසින්න. නොසැලී ඒකායන අධිෂ්ඨානයකින් යුතුව ආයෝජනය කරන්න.

- මුදල් සම්බන්ධයෙන් ඔබට වූ වැරදි සහ පාඩුවලින් අත්දැකීමක් ලබාගන්න. නැවතත් ඔබට එවැනි පාඩු සිදුවීමට ඉඩ නොතබන්න.



## අධිෂ්ඨානයෙන් ප්‍රගතිය කරා පියනඟන්නට කාර්යක්ෂම ලෙස මුදල් කළමනාකරණය කළ යුතු පිළිවෙත

- එදිනෙදා ගේදොර වියදම් හා පවුලේ සම්පූර්ණ ආදායම් ලැයිස්තුගත කර ක්‍රමානුකූලව හඳුනාගන්න.
- පෞද්ගලික/පවුලේ සහ ව්‍යාපාරික වශයෙන් ඔබගේ වියදම් කොටස් දෙකකට වෙන් කර ගන්න.
- ඔබ උපයන මුදලට වඩා අඩුවෙන් වියදම් කරන්න. හදිසි අවස්ථාවන් හිදී පාවිච්චියට අවශ්‍ය මුදල් වෙන් කර තබන්න.
- ඔබගේ ආදරණීයයන්ට දිගු කාලයක් නවසින් පිටව සිටීමට සිදු වීම සහ දිගින් දිගටම නිවසින් පිටව සිටීම වළක්වා ගැනීමට ඔබගේ වියදම්, නිසි පාලනයකින් සහ ක්‍රමවත්ව, වගකීමකින් සිදු කරන්න.
- වත්කම් වර්ධනය කරගැනීමට ඔබට ඇති පහසුම මඟ බැංකු ගිණුමක මුදල් තැන්පත් කිරීමයි. මෙහදී මූල්‍ය සබඳතාවයක් බැංකුව සමග ඇති වේ. ප්‍රමුඛ පෙළේ බැංකුවක මුදල් තැන්පත් කිරීමෙන් ඔබගේ මුදල්වලට වැඩි ආරක්ෂාවක් ලැබෙයි, පොලී උපයා ගත හැක, ණයක් ලබාගැනීමේදී බැංකුව හා ගොඩ නැංවූ මෙම මූල්‍ය ඉතිහාසය වැදගත් වේ.
- අද ඔබගේ ඉතිරි කිරීම්වලින්, අනාගතයේදී ඔබට අවශ්‍ය වෙනත් වත්කම් වන රන්, ඉඩම්, දේපළ, යන්ත්‍ර සූත්‍ර, වාහන ආදිය මිලදී ගත හැකි වනු ඇත.



## මෙතෙර ඉසුරු පතා අධිෂ්ඨානයෙන් එතෙරට යන ඔබ සඳහා

### 1. සංක්‍රමණයට පෙර ඔබගේ නමින් ගිණුමක් විවෘත කරන්න.

- මෙතෙරට මුදල් එවීම සඳහා ඔබගේ ගිණුම් අංකය සහ විස්තර ඔබගේ සේවායෝජකයාට ලබාදෙන්න.
- එය ඔබගේ සේවායෝජකයාටද පහසුවක් වනු ඇත.
- ඔබගේ අතෙ හි මුදල් රඳවාගත යුතු නැති නිසා එහි ආරක්ෂාව ගැන සැලකිලිමත් වීම අවශ්‍ය නොවේ.
- අතෙ හි මුදල් ඇති විට එය නොදැනුවත්වම වියදම් වන ප්‍රවණතාවය වැඩිය.
- කෙලින්ම ඔබේ මුදල් ගිණුමට බැර කිරීම වියදම අවම කරයි.
- මසකට කිහිප වතාවක් මුදල් තැන්පත් කිරීමට ඔබට සිදු නොවේ.
- මෙයින් නිරතුරුවම මුදල් බැර කිරීමට යන වියදම අවම වේ.
- ගිණුමේ ශේෂය මත ගණනය වන පොලිය අහිමි වීම වළක්වා ගත හැක.



## 2. ඔබගේ පවුල සඳහා වෙනම ගිණුමක් විවෘත කරන්න.

- ඔබගේ ගිණුමට මුදල් එවා, ඔබගේ පවුලේ සමාජිකයන්ගේ ගිණුමට ස්ථාවර නියෝගයකින් මුදල් යවන්න.
- ගිණුමෙන් මුදල් ලබාගැනීමට හා භාණ්ඩ මිලදී ගැනීම් සඳහා ATM පහසුකම් සහිත ඩෙබිට් කාඩ්පතක් ලැබෙනු ඇත.
- HNB බැංකු ගිණුම් අතර ස්ථාවර නියෝග සම්පූර්ණයෙන්ම නොමිලේ.
- හදිසි අවස්ථාවකදී අවශ්‍ය වෙලාවට ඔබගේ ගිණුමෙන් මුදල් මාරු කිරීමට ඔබට බැංකුවට නියෝග කළ හැක.

## 3. ඔබ වෙනුවෙන්ම වෙන්වූ ගිණුමක් විවෘත කිරීමේ ඇති වාසි

- එය ඔබට, ඔබගේ සේවායෝජකයාට සහ ඔබගේ පවුලට පහසුවක් වෙයි.
- ඔබගේ ගිණුම පරිහරණය කළ හැක්කේ ඔබට පමණයි.
- මුදල්වල ආරක්ෂාව සහතික කර ඇත.
- මහන්සියෙන් උපයාගන්නා මුදල් අනිසි ලෙස වියදම් නොවන බවට ඔබට සහතිකයක් ඇත.
- නිරතුරුවම ඉතුරුම් වර්ධනය වෙයි.
- මූල්‍ය ගනුදෙනු වාර්තා ඇති නිසා පහසුවෙන් ණය මුදල් ලබාගත හැක.
- ආදායම් උත්පාදක ක්‍රියාකාරකම් සඳහා බැංකුව මගින් මාර්ගෝපදේශය සහ මූල්‍ය උපකාර හිමිවේ.
- සුවිශේෂී අනුපාතයන්ට රක්ෂණාවරණ හිමි කරගත හැක.



## ලොව දිනූ එවන් අධිෂ්ඨානයකින් යුත් තවත් මිනිසෙක්

ජපානයේ කුඩා ගමක බයිසිකල් අළුත්වැඩියාකරුවෙකු වූ සිය පියාණන්ගේ සහ පේශ කර්මාන්තයේ නියැලී සිටි සිය මවගේ සෙනෙහසේ වැඩුණු "හොන්ඩා" වයස අවුඃ 15 දී තම අධ්‍යාපනය අතහැර රැකියාවක් සොයා ටෝකියෝ බලා පිටත් විය. ඉන්පසු ගරාජයක පුහුණුලාභියෙක් ලෙස සිය වෘත්තීය ජීවිතය ඇරඹූ "හොන්ඩා" වසර 6ක් වාහන කාර්මිකයෙකු ලෙස සේවය කළහ.

වයස අවු ඃ 22 දී ඔහු ගමට තමන්ගේම මෝටර් රථ කාර්මික වැඩපොළක් ආරම්භ කළහ. ඉන්පසු ටොයොටා සමාගමේ ඉංජිනේරුවරයෙකුගේ ඇබෑර්තුවකට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට අසමත් වීම නිසා රැකියා විරහිතව කලක් සිට පසුව ඔහු තම නිවසේම ස්කූටර් රථ නිපදවීම ආරම්භ කළේය.

ඉන්පසු මෝටර් සයිකල් එන්ජින්වල භාවිතය සඳහා "පිස්ටන් රින්ග්ස්" නිපදවූ ඔහු 1948 දී "හොන්ඩා" මෝටර් සමාගමේ සභාපති වශයෙන් සම්පූර්ණයෙන්ම මෝටර් සයිකල් නිපදවීම ආරම්භ කළේය.

වර්තමානයේ "හොන්ඩා" සමාගම ලෝකයේ සුපතළ නමක් දරමින් වැඩි වශයෙන්ම මෝටර් සයිකල් අලෙවි කරන සමාගමක් බවට පත් වී ඇත. මෙම ඩොලර් බිලියන ගණනක් වටිනා ව්‍යාපාරයක හිමි කරුවා 'හොන්ඩා' නම් ඒ මහා අධිෂ්ඨානයක් සිතෙහි රඳවාගත් මිනිසා බව අද මුළු ලොවටම අභිමානයෙන් කිව හැක.

## හැටන් නැෂනල් බැංකුවේ ගිණුමක් විවෘත කිරීමේත්, කෑෂ් එක්ස්ප්‍රස් මුදල් හුවමාරු ක්‍රමය භාවිතා කිරීමේත් අපට ඇති වාසි

- ඉක්මන් සහ පහසුව
- එතෙර සිට එවන මුදල් කෙළින්ම ගිණුමට බැර වේ
- සම්පූර්ණ මුදල අතටම
- අමතර ගාස්තු නැත
- ඕනෑම මොහොතක මුදල් ආපසු ගැනීමේ හැකියාව
- මුදල් ගැනීමට කවුන්ටරයේ පෝලිමේ සිටීමට සිදු නොවේ
- මුදල් ආපසු ගැනීම සඳහා ATM කාඩ්පතක්
- දිවයින පුරා 370කට අධික ATM යන්ත්‍ර මගින් සැලසෙන පැය 24 පුරා සේවය

වැඩි විස්තර සඳහා ඕනෑම HNB බැංකු ඒකකයකින් හෝ **011 266 1990** අංකයෙන් හිරන්ත අමතන්න.

HATTON NATIONAL BANK

HNB

ඔබේ ප්‍රගතියේ සහකරු